ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය - 2021

----------------------------------------------------------

# 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ අංක 38 දරන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් පිරිවැය | මේ වන විට මෝටර් වාහන තක්සේරු කිරීම සඳහා අදාළ තක්සේරු නිලධාරීන් පැමිණි අතර, තක්සේරු වාර්තාව ලැබීමට නියමිතය. දැව භාණ්ඩ හා කාර්යාල උපකරණ ප්‍රත්‍යාගණනය සම්බන්ධයෙන් සියළු | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| රු.156,516,853 ක් වූ දේපල, පිරියත හා උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | තොරතුරු තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කර ඇති නමුත් මේ වන තෙක් තක්සේරු කාර්යය ආරම්භ කර නොමැත. | |
| (ආ) ජනාධිපති ලේකම් කාර්යාලයෙන් 2019 දෙසැම්බර් මාසයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබුණු මෝටර් රථ 02 හි අයිතිය පවරා ගෙන වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | රටේ පැවති කොවිඩ් 19 තත්ත්වය මත ප්‍රමාද වූ අතර මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වෙත 2022.03.14 දින ලියාපදිංචි තැපැල් මගින් වාහන පවරා ගැනීමට අදාළ තොරතුරු ඉදිරිපත් කර ඇත. | වාහනවල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම<br>රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම<br>රු. | වෙනස<br>රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| දේපල, පිරියත හා උපකරණ - දැව භාණ්ඩ | 79,710,032 | 79,494,536 | 235,462 | මෙම වෙනස සැසඳීම සඳහා විස්තරාත්මක තොරතුරු රජයේ විගණන අංශයෙන් ලැබීමට නියමිතය. ඉන් පසු පිළිතුරු ලබා දීමට නියමිතයි. | දැව භාණ්ඩ සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදිව පවත්වා ගත යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2016 මාර්තු 01 දිනැති අංක 2016/4 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | (i) ස්වයං මූල්‍ය පාඨමාලාවන්හි ආදායම හා වියදම ශුන්‍ය විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාළ ස්වයං මූල්‍ය පාඨමාලා 04 ක රු.4,203,037 ක අලාභයක් හා පාඨමාලා 05 ක රු.7,908,474 ක ලාභයක් | 2021 වර්ෂයේ කොරෝනා වසංගත තත්ත්වය මත ඇතැම් පාඨමාලාවල ඇස්තමේන්තුගත ආදායම සැලසුම් කළ පරිදි ලැබී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ගලපා තිබුණි. | | |
| | (ii)විශ්වවිද්‍යාලය විසින් ස්වයං මූල්‍ය පාඨමාලා සඳහා 2021 වර්ෂයට අදාලව සකස් කර ඇති අයවැය ඇස්තමේන්තුවේ සියයට 10 සිට සියයට 25 දක්වා ප්‍රමාණයක් විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලට බැර කල යුතු වුවද විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලක් පිහිටුවා නොතිබුණි. ඒ අනුව වර්ෂය සඳහා විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලට බැර කළ යුතු රු.4,935,788 ක මුදල ඇතුළුව එකතුව රු.6,378,992 ක් මහෝපාධ්‍යායාය අරමුදලට බැර කර තිබුණි. | විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලක් පිහිටුවීම මේ වන තෙක් සිදු කර නොමැති බැවින් ඒ සඳහා වෙන් කර ඇති මුදල මහෝපාධ්‍යාය අරමුදලට බැර කර ඇති අතර, විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදල පිහිටුවීමෙන් අනතුරුව ඒ සඳහා වෙන් කරනු ලබන මුදල් අදාළ අරමුදලට බැර කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 751 | භාෂා නිපුණතා සංවර්ධන මධ්‍යස්ථානය සඳහා මිලදී ගෙන තිබුණු පිරිවැය රු.9,361,532 ක් වූ භාණ්ඩ ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. | ඉන්වෙන්ට්‍රියට ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) 2016 නොවැම්බර් 30 දිනැති අංක HE/UD/03/04/BPU /02 (III) දරන උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියේ 3 ඡේදය | අමතර ප්‍රතිපාදන ලබා නොදීමේ පදනම මත සහ ස්වේච්ඡා කථිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගැනීමේ පදනම මත භාෂා නිපුණතා සංවර්ධන අධ්‍යයන අංශයක් පිහිටුවීමට අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාදී තිබුණි. ඒ වෙනුවට 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා බාහිර කථිකාචාර්යවරු බඳවාගෙන ඔවුන් වෙත රු.7,939,227 ක දීමනා සහ 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ආධුනික කථිකාචාර්යවරු හතර දෙනෙකු අනුයුක්ත කර ඔවුන් වෙත රු.27,060,714 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | ස්වෙච්ඡා පදනම යටතේ අධ්‍යයනාංශය පිහිට වුවද පසුව පාඨමාලා වර්ධනය හා උපාධි විෂයයක් ලෙස විෂය පාඨමාලා පුළුල් වීම හේතු කොට ගෙන ආධුනික කථිකාචාර්ය තනතුරු සඳහා ගුරුවරුන් බඳවා ගත් බව දන්වා සිටිමි.<br>තවත් කථිකාචාර්ය තනතුරු 4 ක් අනුමත කරවා ගනු ලැබුවේ අධ්‍යයන පාඨමාලා පුළුල් වීම සහ ඒ විෂයයන්ට අදාළ පාඨමාලා පුළුල් වී ඉගැන්වීම පැය ගණන් ද ඉතා අධික වූ බැවිනි. | අදාළ අනුමැතියට යටත්ව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.47,275,438 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.10,026,815 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.57,302,253 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පුනරාවර්ථන වියදම් සඳහා රජයේ ආධාර, ඉපයූ බාහිර ව්‍යාපෘති ආදායම හා අනෙකුත් ආදායම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍යතාව නිසි පරිදි හඳුනා නොගෙන 2019 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු පිරිවැය රු.2,349,525 ක් වූ පිළිතුරු පත්‍ර පොත් තොගයක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටද ඉතිරිවී තිබුණි. | සමීක්ෂණ වාර්තාව අනුව කල්ඉකුත් වූ හා භාවිතයට ගත නොහැකි භාණ්ඩ තොගවලින් ඉවත් කර ඇති අතර අපහරණය කිරීමට නියමිතය. විභාග සඳහා අවශ්‍යවන පිළිතුරු පොත් අදාළ විභාග, පැවති වසංගත තත්ත්වය මත අපේක්ෂිත ආකාරයෙන් නොපැවැත්වීම හා මාර්ගගතව පැවැත්වීම මත පිළිතුරු පත්‍ර පොත් භාවිතයට ගැනීම සීමා වී ඇත. | අවශ්‍යතාව නිසි පරිදි හඳුනාගෙන මිලදී ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දැනට පවත්වා ගෙන යනු ලබන පාඨමාලා 12 හි විෂය නිර්දේශ සංශෝධනය නොකර වසර 03 ක් ගතවී තිබුණු අතර නව පාඨමාලා හඳුන්වාදීම කෙරෙහිද අවධානය යොමුකර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට නව පාඨමාලා 15 ක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කර ඇත. | විෂය නිර්දේෂ කාලීනව සංශෝධනය කල යුතු අතර නව පාඨමාලා හඳුන්වාදීම කෙරෙහි කළමනාකරණයෙහි අවධානය යොමුකළ යුතුය. |

**3.3 අරමුදල් ඌන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.15,779,316 ක් වූ අරමුදල් 03 ක් අදාළ අරමුණු ඉටුකර ගැනීම සඳහා උපයෝජනය කර නොතිබුණි. | ශිෂ්‍ය කේන්ද්‍රිය කටයුතු සම්බන්ධව මෙම අරමුදල් ප්‍රධාන වශයෙන් භාවිතා වන අතර පසුගිය වර්ෂයේ සිට ශිෂ්‍යයන් අධ්‍යයන කටයුතු සඳහා මාර්ගගතව සම්බන්ධ වූ බැවින් අපේක්ෂිත ලෙස අරමුදල් උපයෝජනය නොවූ අතර Glorious Sun අරමුදල හා ශිෂ්‍යත්ව අරමුදල් 2022 වර්ෂයේ දී වියදම් වී ඇත. | අදාළ අරමුදල් පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා උපයෝජනය කල යුතුය. |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාෂා නිපුණතා සංවර්ධන මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ පිහිටි පරිගණක විද්‍යාගාරය වෙත ලබාදී තිබුණු වටිනාකම හඳුනාගත නොහැකි පරිගණක 37 ක් හා පරිගණක මේස හා පුටු 47 ක්ද 2019 දෙසැම්බර් මාසයේ මිලදීගෙන තිබුණු වටිනාකම රු.130,869 ක් වූ කාර්යාල උපකරණද මෙම වාර්තාවේ දිනය දක්වාම නිෂ්කාර්යව පැවතුණි. | පරිගණක යන්ත්‍ර නිශ්ක්‍රීයව තබා තිබීමට සිදු වූයේ අන්තර්ජාල පහසුකම් ලබාදී නොමැති බැවිනි. අධ්‍යයනාංශයෙන් හා භාෂා පීඨය මඟින් ඉල්ලීම් කළ ද එම කටයුත්ත සම්පූර්ණ නොවීය. වර්තමානය වන විට අන්තර්ජාල පහසුකම් සලසා දීමට අධ්‍යයනාංශය මඟින් කටයුතු සම්පාදනය කරගෙන යන බව දන්වා සිටිමි.<br><br>විශ්වවිද්‍යාලයට සිසුන් කැඳවීමට පැවති වසංගත තත්ත්වය හේතුවෙන් නොහැකි විය. අදාළ පුටු කිසියම් අවර්ණ වීමක් සිදු වී ඇත. මේ පිළිබඳව සොයා බලා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කල යුතුය. |

**3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විශ්වවිද්‍යාලයේ කොළඹ පරිශ්‍රයේ පස්මහල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.252,327,545 ක කොන්ත්‍රාත් වටිනාකමක් සහිතව වර්ෂයකින් නිම කිරීමේ කොන්දේසිය මත 2019 ඔක්තෝබර් 02 දින ප්‍රදානය කර තිබුණි. එමෙන්ම 2019 නොවැම්බර් 18 දින කොන්ත්‍රාත්කරු වෙත රු.14,508,834 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරමක් ලබාදී තිබුණු නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. මේ අනුව වසර 2 කට වඩා වැඩි කාලයක් පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු වෙත රජයේ මුදල් රඳවා තබාගැනීමට ඉඩකඩ සලසා තිබුණු අතර එම මුදල් නැවත අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | කොළඹ මහනගර සභාවෙන් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ඉදිකිරීම් අවසර පත්‍රය 2021.12.03 දින විශ්වවිද්‍යාලයට ලැබුණි. ඒ අනුව එම අනුමැතිය ලැබුණු පසු ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය ඉකුත්ව ඇති බැවින් හා රටේ පවතින තත්ත්වය අනුව ඉදිකිරීම් අමුද්‍රව්‍ය වල මිල වැඩි වීම හේතුවෙන් කොන්ත්‍රාත් ආයතන විසින් ඉදිකිරීම් මිල වැඩි වීමක් ඉල්ලුම් කර ඇත. එබැවින් ඒ සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය ලේඛන අධ්‍යාපන අමාත්‍යාංශයේ සැලසුම් අංශය වෙත යොමු කර ඇත. මේ වන විට අදාළ ඇස්තමේන්තුව ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව දන්වා ඇත. | ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාල පූර්ව කාර්යයන් නිසි පරිදි සැලසුම් කළ යුතුය. |